# අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රාගත ඉගැන්වීම් සහ ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා පෙළ ගැස්වීමේ න්‍යාය පිළිබඳ තුලනාත්මක විමසුමක්

**කරඳගොල්ලේ විජිතතිස්ස හිමි**[1]

මෙම පර්යේෂණ පත්‍රිකාවේ මුඛ්‍ය සාධනය වනුයේ ඒබ්‍රහම් මාස්ලෝ විසින් පුද්ගල අභිප්‍රේරණය සම්බන්ධයෙන් ඉදිරිපත්කොට ඇති අවශ්‍යතා පෙළ ගැස්වීමේ න්‍යාය හා අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රාන්තර්ගත ධර්ම කරුණු පිළිබඳ තුලනාත්මක විමසුමක යෙදීමය.

බටහිර දර්ශනය හා මනෝවිද්‍යා විෂයක්ෂෙත්‍රයෙහි එක් එක් ගුරුකුලයන් අභිප්‍රේරණය පිළිබඳව විවිධ මතවාදයන් ඉදිරිපත් කොට ඇති බවත් පෙනේ. ඒ අතර අවශ්‍යතා පෙළගැස්වීමේ න්‍යාය වඩාත් ප්‍රකට න්‍යායයක් ලෙස හැඳින්විය හැකිය.

මෙහිදී අපගේ අවධානය යොමුකරනු ලබන්නේ ඒබ්‍රහම් මාස්ලෝ විසින් 1943 දී පුද්ගල අභිප්‍රේරණය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති අවශ්‍යතා පෙළ ගැස්වීමේ න්‍යාය කෙරෙහිය. මෙම න්‍යායට අනුව පුද්ගලයන් තුළ සුවිශේෂී දැඩි අවශ්‍යතා පවතින අතර ඒවා යම් ආකාරයකට අනුව පෙළ ගැස්වීමක් සිදු කළ හැකි වේ

පුද්ගල චර්යාව චේතනාත්මකව සිදුවන බව බෞද්ධ දර්ශනාගත ඉගැන්වීමයි. සෑම සත්වයෙක්ම සැපයට කැමති වේ. මෙම සැපවිඳීමේ කැමැත්තත් දුක්විඳීමේ අකමැත්තත් අනුව පුද්ගලයා චර්යාවන් දක්වයි.

පත්තකම්ම සූත්‍රයෙහි පුද්ගලයාගේ මෙලොව ජීවිතයෙන් ඔබ්බට ද පුද්ගල අවශ්‍යතා දක්වා ඇත. එහෙත් මාස්ලෝගේ න්‍යාය මෙලොව ජීවිතය තුළ අවශ්‍යතා කෙරෙහි පමණක් සීමා වී ඇත. මේ අනුව පැහැදිලි වන්නේ අංගුත්තර නිකායේ පත්ත කම්ම සූත්‍රයෙහි නූතන දාර්ශනිකයන් පුද්ගල අවශ්‍යතාවන් අනුව

---

[1] සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය' අනුරාධපුර
Email-vijithatissa@yahoo.com

අභිප්‍රේරණ ක්‍රියාවලිය විස්තර කොට ඇති ආකාරයට වඩා ක්‍රමික හා පූර්ණ පුද්ගල අවශ්‍යතා ධූරාවලියක් අන්තර්ගත වන බවයි.

ප්‍රමුඛ පද: අංගුත්තර නිකාය පත්තකම්ම සූත්‍රය, අභිප්‍රේරණය මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය

**Title:** A comparative Examination of Maslow’s Theory of Needs on the Basis & the *Pattakamma Sutta* of the Anguttara Nikaya

**Keywords:** Patthakamma Sutta in Anguttara Nikaya, Motivation, Maslow's hierarchy of needs